







CHIKU'S -KITCHEN-

# බටර් කේක්

## අවශ්‍ය ද්‍රව්‍යඃ

- සාමාන්‍ය පාන් පිටි ග්‍රෑම් 100
- සීනි ග්‍රෑම් 100
- බටර් ග්‍රෑම් 25
- මාගරින් 75
- බිත්තර 02 යි
- බේකින් පවුඩර් කෑපූ තේ හැදි 02
- දෙහි යුෂ තේ හැඳි 01
- කිරිපිටි මේස හැඳි 01
  (මෙය කිරිපිටි තේ හැදි 02ක් වතුර මේස හැඳි 01ක දියකර සාදාගන්න)
- වැනිලා තේ හැඳි 01යි.

## සාදාන ක්‍රමය.

පළමුව පාන්පිටි ග්‍රෑම් 100ට බේකින් පවුඩර් තේ හැදි 02ක එකතුකර තුන්වරක් හොඳින් හලාගන්න. එය පසෙකින් තබාගන්න.

ඉන්පසුව සීනි ග්‍රෑම් 100 හොදින් කුඩුකරගන්න. භාජනයකට කුඩුකරගත් සීනිටික දමා, එයටම බටර් සහ මාගරින්ද එකතු කර හොඳින් බීට් කරගන්න. මෙහිදී සීනි කැට ගතිය නැතුව මිශ්‍රණය ක්‍රීම් එකක් වනතුරු බීට් කරගන්න. ඉන්පසු එයටම දෙහි යුෂ, කිරිපිටි (දියකරගත්) සහ වැනිලා එකතු කර තරමක් බීට් කරගන්න.

ඊටපසු වරකට එක බැගින් බිත්තර කඩා දමා හොඳින් බීට් කරගන්න. බිත්තර දෙකම දමා බීට් කර ගැනීමෙන් අනතුරුව පාන් පිටිද ටික ටික එකතු කරමින් හොඳින් බීට් කරන්න.

ඉන්පසු බේකින් කුටියක් ගෙන එයට නොන්ස්ටික් බේකින් පේපර් එකක් දමා ලයින් කරගන්න. පසුව, සාදාගත් මිශ්‍රණය එයට දමා, වායු බුබුළු ඉවත් වනසේ තැටිය මදක් මේස මතට තට්ටු කරන්න.

අවන් එක සෙන්ටි ග්‍රේඩ් $160^0$ ක උෂ්ණත්වයට විනාඩි 10ක් රත්කරගන්න. ඉන්පසු කේක් මිශ්‍රණය සහිත තැටිය අවන් එකට තවත් විනාඩි 40ක් බේක් කරගන්න.

ඉන් අනතුරුව කේක් එක අවන් එකෙන් පිටතට ගෙන එය මැදට ටූත් පික් එකකින් ඇන ඉවතට ගෙන තෙත ගිතිය තිබේදැයි පරීක්ෂා කරන්න. තෙත ගතිය නැතිව වියලිව ඇත්නම් පදම හරි.



ඊට පසුව දැලක් මතට කේක් එක නොපිටට හරවා බේකින් පේපර් එක ගලවා නිවෙන්න තබන්න කේක් එක තැටිය මතම තිබුනොත් මැදින් බැසීමට ඉඩඇත. නිවුන පසු එය නැවත ලෑල්ලක් මතට හරවා ගන්න.




කොඩියගෙ ලම
ලක්ෂමන් කොඩිතුවක්කු

# යුද්ධය අවශ්‍ය කාටද ?

මා යුද්ධයක් දැසින් දුටුවේ විදේශයකදීය. එය රටවල් දෙකක් අතර යුද්ධයකි. නිවැරදිව නිර්වචනය කළහොත් එය මස්තබාල්දු යුද්ධයකි. මා කුවේට් දේශයට රැකියාව සඳහා පා තැබුවේ 1988 වසරේදීය. ඒ වනවිට අප රට තුළද ඇතිවූ තිබුණේ ගැටුම්වලින් පිරි අරාජික තත්වයකි. ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ වචනවලින් කිවහොත් දෙකොන ගිනිගත් විලක්කුවකි. දෙපිලේම නාඳුනන තුවක්කුකරුවන් කවුරුත් දන්නා හඳුනන මිනිසුන් බිලිගන්නා යුගයකි. එම යුගය මාත් තව මිතුරන් කිහිපදෙනෙකුත් ජීවිතය ගැන බියෙන් සිටි අවදියකි, මා රැකියාව කළ සෙලින්කෝ මුද්‍රණ ආයතනයට පැමිණි කුවෙට් ව්‍යාපාරිකයා අප අංශයට පැමිණ ඔහුගේ කාඩ්පතක් දී නැවතී සිටින හෝටලයට ඇමතුමක් දෙන මෙන් ඉල්ලා සිටියේය. මා දෙවරක් නොසිතා ඔහුට දුන් ඇමතුමේ ප්‍රතිපලයක් ලෙසින් ඔහුට හිමි

48 වන පිටට

